හිජ්රි 1447ක් වූ දුල්-හිජ්ජා මස 19 වන දින එනම් ක්‍රි.ව. 2026 ජූනි මස 05 වන දින ජුම්ආ දේශනය

# ඉස්ලාම් දහම අවධාරණය කරන ගෞරවයේ ශ්‍රේෂ්ඨත්වය

සදා සර්වඥ වූ ද, සර්වබලධාරී වූ ද අල්ලාහ්ට ම සියලු ප්‍රශංසා හිමිය. කරුණාභරිත අල්ලාහ් මිනිසාට ඍජු මාර්ගය පෙන්වා දුන්නේ ය. ඒ මිනිසා ඔහුට කෘතඥ පූර්වක වන්නේ ද නැතහොත් අකෘතඥ වන්නේ ද යන්න තෝරාගැනීම සඳහා ය. එබැවින් කවරෙකු කෘතඥ වූයේ ද, ඔහුගේ ප්‍රතිඵලය වනුයේ අසීමිත භාග්‍යයන්ගෙන් යුත් ස්වර්ගය සහ මහත් වූ රාජධානියකි. තවද කවරෙකු අකෘතඥ වූයේ ද, ඔහුට අල්ලාහ් හැර වෙනත් කිසිදු ආරක්ෂකයෙකු හෝ උපකාරකයෙකු නොලැබෙන්නේ ය.

නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිදු දෙවියෙකු නොමැති බවට මම සාක්ෂි දරමි. ඔහු අන්ධකාරය ආලෝකය බවටත්, පීඩනයන් සහ දුෂ්කරතා අපේක්ෂාවන් සහ සතුට බවටත් පත්කරන්නා වූ සාක්ෂියකි. තවද, අපගේ නබි මුහම්මද් (සල්) තුමාණන් යනු අල්ලාහ්ගේ ගැත්තා බවටත්, ශුභාරංචි ගෙන එන්නෙකු හා අවවාද කරන්නෙකු ලෙස එවනු ලැබූ දූතයාණන් බවටත් මම සාක්ෂි දරමි. එතුමාණෝ අල්ලාහ්ගේ අනුමැතිය මත ජනයින්ව ඔහු වෙතට කැඳවන්නා වූ , දීප්තිමත් පහනක් බඳු වූ  දූතයාණන් ය.

යා අල්ලාහ් එතුමාණන්ට ද, එතුමාණන්ගේ පවුලේ අයට ද, සහගාමිකයින්ට ද ඔබගේ ආශිර්වාදය සහ අසීමිත වූ ශාන්තිය ලබා දෙනු මැනව!
ඉන්පසුව: අල්ලාහ්ගේ ගැත්තනි අති උත්තරීතර වූ අල්ලාහ් අණ කළ පරිදි ම, අල්ලාහ්ට බියබැතිමත් (තක්වාශීලී) වන ලෙස මම ඔබටත්, මා හටත් අවවාද කරන්නෙමි.

**විශ්වාස කළවුනි, අල්ලාහ්ට බිය භක්තිමත් වවු. තවද සෑම ආත්මයක්ම හෙට දින සඳහා (තමන්ට) පෙරටු කර ගත් දෑ පිළිබඳව අවධානය යොමු කරවු. තවද අල්ලාහ්ට බිය භක්තිමත් වවු. සැබැවින්ම අල්ලාහ් නුඹලා කරන දෑ පිළිබඳව අභිඥානවන්තයාය.**

**[සූරා අල්-හෂ්ර් : 18]**

## අල්ලාහ්ගේ ගැත්තනි!

නියත වශයෙන් ම, ඉස්ලාම් දහම අවධාරණය කරන ගෞරවය දැක්වීම යනු ඉස්ලාමීය සාරධර්ම අතරින් අතිශය උතුම් වූ සාරධර්මයකි. එය යහපත් වූ හදවතකින් ද, සන්සුන් වූ ආත්මයකින් ද පැන නගින්නකි. එයින් අදහස් වන්නේ අන් අය අගය කිරීම සහ ඔවුන් සමඟ ගෞරවාන්විත ව හා ප්‍රශංසනීය අයුරින් කටයුතු කිරීම ය. ඉස්ලාමීය නෛතික (ශරීආ) මූලාශ්‍රයන් දෙස අවධානය යොමු කරන්නෙකුට, විවිධ ස්වරූපයන් ඔස්සේ අන් අයට ගෞරවය දැක්වීම සඳහා ඉස්ලාමය ලබා දී ඇති පැහැදිලි දිරිගැන්වීම් මැනවින් අවබෝධ වනු ඇත. යහපත් වදන් පැවසීමටත්, ප්‍රසන්න මුහුණකින් යුක්ත වීමටත් අණ කර ඇති ඉස්ලාමය, අසභ්‍ය සහ නින්දිත වචන භාවිතය මුළුමනින් ම ප්‍රතික්ෂේප කර ඇත. එය මුස්ලිම් නොවන අයෙකු සමඟ කටයුතු කිරීමේ දී වුව ද එසේ ම ය.

අති උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි.

**තවද, තවද නුඹලා මිනිසුනට යහ දේ පවසවු**

**[සූරා අල්-බකරා: 83]**

තවද, අබ්දුල්ලාහ් බින් අම්ර් (රළි) තුමාණන්ගෙන් වාර්තා කරන ලද හදීසයකට අනුව. අල්ලාහ්ගේ දූතයාණන් (සල්) තුමාණන් මෙසේ පැවසූහ:

**"නියත වශයෙන් ම ඔබ අතරින් වඩාත් ශ්‍රේෂ්ඨතමයා වනුයේ, ඔබගෙන් වඩාත් යහපත් ගතිපැවතුම් (උසස් චරිතයක්) ඇත්තා ය."**

**[ග්‍රන්ථය: බුහාරි සහ මුස්ලිම්]**

**ඔබගේ දිවියේ කටයුතුවල යහපැවැත්ම සඳහා පදනම වන්නේ ඔබ සතු උසස් ගුණධර්මයන් ය,**

**එබැවින්, යහපත් ගුණධර්ම තුළින් ඔබගේ ආත්මය හික්මවා ගන්න, එවිට එය නිවැරදි මාවතේ ඍජු වනු ඇත.**

**ආත්මය එහි ඇති යහපත්භාවය හේතුවෙන් උතුම් වූ ශාන්තියක් සහ සුවතාවක් භුක්ති විඳියි,**

**එහෙත්, එහි ඇති අයහපත්භාවය හේතුවෙන් එය අතිශය විනාශකාරී වූ ද, අප්‍රසන්න වූ ද ඉරණමකට ඇද වැටෙයි.**

**මුස්ලිම් සහෝදරවරුනි!**

නියත වශයෙන් ම, මිනිසුන් අතර පවතින ගෞරවය දැක්වීම විවිධ ස්වරූපයන්ගෙන් හා විවිධ අවස්ථාවන්ගෙන් සමන්විත වේ. ඒ අතුරින් අතිශය ශ්‍රේෂ්ඨතම වන්නේ: අති උත්තරීතර වූ අල්ලාහ්ට ද, එතුමාගේ දූතයාණන් (සල්) තුමාණන්ට ද ගෞරව කිරීම සහ අල්ලාහ්ගේ දහම උතුම් කොට සැලකීම ය. මෙය ප්‍රායෝගික ව සිදුවන්නේ ඉස්ලාමීය නෛතික (ශරීආ) අණකිරීම්වලට ගරු කිරීමෙන් සහ අති උත්තරීතර අල්ලාහ්ගේ පූජනීයත්වයන්ට හා සීමාවන්ට නිසි අයුරින් අනුගත වීමෙනි. මේ සම්බන්ධයෙන් ශුද්ධ වූ අල්-කුර්ආනය අපට මෙලෙස මඟපෙන්වයි:

**කරුණ නම්. කවරෙකු අල්ලාහ්ට අයත් (දහමෙහි) සලකුණු ගරු කරන්නේද සැබැවින්ම එය හදවත්හි (ඇති) බිය භක්තිමත්භාවයෙනි.**

**[සූරා අල්-හජ්: 32]**

තවද, ගෞරවය දැක්වීමේ වැදගත් ස්වරූපයන් අතරින් එකක් වන්නේ: ප්‍රියමනාප යහපත් වදන් තෝරා භාවිත කිරීමත්, අන් අයගේ සිත් රිදවන ප්‍රකාශයන්ගෙන් සහ අපහාසාත්මක ඉරියව්වලින් (සංඥාවලින්) සම්පූර්ණයෙන් ම වැළකී සිටීමත් ය. මෙම කරුණු දෙක ම සම්බන්ධයෙන් අති උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

**(නැති තැන) නුගුණ කියන හා (ඇති තැන) අවමන් කරන සෑම කෙනෙකුටම විනාශය අත්වේවා!**

**[සූරා අල්-හුමසා: 1]**

මෙහිදී 'හම්ස්' (هَمْز) යන්නෙන් අදහස් වන්නේ ක්‍රියාවෙන් අපහාස කිරීම සහ ඇස් බැල්මෙන් පහත් කොට සැලකීම ය. තවද 'ලම්ස්' (لَمْز) යනු වචනයෙන් අපහාස හා නින්දා කිරීම ය. මීට ප්‍රතිවිරුද්ධ ව, සැමවිටම යහපත් වූ දේ ම සිදු කරන ලෙස අල්ලාහ් අණ කර ඇත.

**(නබිවරය,) (එකිනෙකා කථා කරන විට) ඉතා යහපත් දෑය පවසන්නැ"යි මාගේ ගැත්තන්ට නුඹ පවසවු. (මන්දයත්) සැබැවින්ම ෂෙයිතාන්* නුඹලා අතර භේදභින්නභාවය ඇති කරයි. සැබැවින්ම ෂෙයිතාන් මිනිසාට පැහැදිලි සතුරෙකු විය.**

**[සූරා අල්-ඉස්රා: 53]**

**අබූ උමාමා (රළි) තුමාණන්ගෙන් මෙසේ වාර්තා වේ:**

"තරුණයෙකු නබි (සල්) තුමාණන් වෙත පැමිණ, අහෝ අල්ලාහ්ගේ දූතයාණෙනි මට zසිනා (අනාචාරයේ) යෙදීමට අවසර ලබා දෙනු මැනව යැයි පැවසී ය.

එවිට එහි සිටි පිරිස ඔහු දෙසට හැරී, නවත්වන්න! නවත්වන්න! (මොනවාද මේ පවසන්නේ!) යැයි කියමින් ඔහුට දැඩි ලෙස දෝෂාරෝපණය කළහ. එහෙත් නබි (සල්) තුමාණන්, මා වෙත ළං වන්න යැයි ඔහුට පැවසූහ. ඔහු එතුමාණන්ට සමීප වී අසුන් ගත්තේ ය.

එවිට එතුමාණන් මෙම ක්‍රියාව ඔබගේ මවට සිදුවනවාට ඔබ කැමති ද? යැයි ඇසූහ. ඔහු අල්ලාහ් මත දිවුරා පවසමි, නැත! කරුණාභරිත අල්ලාහ් මා ඔබ වෙනුවෙන් කැපකරන්නෙකු බවට පත් කරත්වා!' යනුවෙන් පිළිතුරු දුන්නේ ය. නබි (සල්) තුමාණෝ, මිනිසුන් ද එලෙස තම මව්වරුන්ට එය සිදුවනවාට කැමති වන්නේ නැත' යැයි පැවසූහ.

(ඉන්පසු) එතුමාණෝ ඔබගේ දියණියට එලෙස සිදුවනවාට ඔබ කැමති ද? යැයි ඇසූහ. ඔහු: අහෝ අල්ලාහ්ගේ දූතයාණෙනි, කරුණාභරිත අල්ලාහ් මත දිවුරා පවසමි, නැත! කරුණාභරිත අල්ලාහ් මා ඔබ වෙනුවෙන් කැපකරන්නෙකු බවට පත් කරත්වා!' යනුවෙන් පිළිතුරු දුන්නේ ය. නබි (සල්) තුමාණෝ: මිනිසුන් ද එලෙස ම, තම දියණියන්ට එය සිදුවනවාට කැමති වන්නේ නැත' යැයි පැවසූහ.

(ඉන්පසු) එතුමාණෝ: ඔබගේ සහෝදරියට එය සිදුවනවාට ඔබ කැමති ද? යැයි ඇසූහ. ඔහු: අල්ලාහ් මත දිවුරා පවසමි, නැත! කරුණාභරිත අල්ලාහ් මා ඔබ වෙනුවෙන් කැපකරන්නෙකු බවට පත් කරත්වා! යැයි පිළිතුරු දුන්නේ ය. නබි (සල්) තුමාණෝ: මිනිසුන් ද එලෙස ම, තම සහෝදරියන්ට එය සිදුවනවාට කැමති වන්නේ නැත' යැයි පැවසූහ.

(ඉන්පසු) එතුමාණෝ:ඔබගේ පියාගේ සහෝදරියට (නැන්දණියට) එය සිදුවනවාට ඔබ කැමති ද?' යැයි ඇසූහ. ඔහු: කරුණාභරිත අල්ලාහ් මත දිවුරා පවසමි, නැත! කරුණාභරිත අල්ලාහ් මා ඔබ වෙනුවෙන් කැපකරන්නෙකු බවට පත් කරත්වා!' යැයි පිළිතුරු දුන්නේ ය. නබි (සල්) තුමාණන්: 'එලෙස ම, මිනිසුන් ද තම පියාගේ සහෝදරියන්ට එය සිදුවනවාට කැමති වන්නේ නැත' යැයි පැවසූහ.

(ඉන්පසු) එතුමාණෝ: ඔබගේ මවගේ සහෝදරියට (පුංචි අම්මාට) එය සිදුවනවාට ඔබ කැමති ද?' යැයි ඇසූහ. ඔහු: කරුණාභරිත අල්ලාහ් මත දිවුරා පවසමි, නැත! අල්ලාහ් මා ඔබ වෙනුවෙන් කැපකරන්නෙකු බවට පත් කරත්වා!යැයි පිළිතුරු දුන්නේ ය. නබි (සල්) තුමාණෝ: එලෙස ම, මිනිසුන් ද තම මවගේ සහෝදරියන්ට එය සිදුවනවාට කැමති වන්නේ නැත යැයි පැවසූහ.

අනතුරුව, එතුමාණන් තම අත ඔහු මත තබා මෙසේ ප්‍රාර්ථනා කළහ: කරුණාභරිත යා අල්ලාහ් මොහුගේ පාපයන්ට සමාව ලබා දෙනු මැනව. මොහුගේ හදවත පවිත්‍ර කරනු මැනව. මොහුගේ පතිවෘත්තාව (රහස්‍ය අවයවයන්) ආරක්ෂා කරනු මැනව!

ඉන් පසුව, එම තරුණයා කිසිදිනෙක එවැනි කිසිදු (අයහපත්) දෙයක් කෙරෙහි අවධානය යොමු කළේ නැත.

[ග්‍රන්ථය: අහ්මද්]

මිනිසුන්ගේ බුද්ධියට ගරු කිරීමේ තවත් අංගයක් වන්නේ: යම් කරුණක් අවබෝධ කර ගැනීමේ දී පුද්ගලයන් අතර ඇති වෙනස්කම් කෙරෙහි සැලකිලිමත් වීම ය. විශේෂයෙන් ම, ජනයාගේ බුද්ධි මට්ටම, අවබෝධ කරගැනීමේ හැකියාව සහ අධ්‍යාපනික මට්ටම එකිනෙකාට වෙනස් වන බව අප දන්නා බැවිනි. සහීහ් අල්-බුහාරි ග්‍රන්ථයෙහි අලි (රළි) තුමාණන් මෙසේ ප්‍රකාශ කර ඇත:

"ජනයාට ඔවුන්ට අවබෝධ කරගත හැකි දෑ (පමණක්) පවසන්න. අල්ලාහ්ට සහ ඔහුගේ දූතයාණන්ට බොරු කිරීම (ඔවුන් විසින් ඔබව ප්‍රතික්ෂේප කිරීම) ඔබ කැමති වන්නෙහි ද?"

## විශ්වාසවන්තයිනි!

තවද, ගෞරවය දැක්වීමේ තවත් ස්වරූපයක් වන්නේ: කිසිදු ආකාරයක සිත් රිදවීමකින්, බැන වැදීමකින් හෝ දැඩි දෝෂාරෝපණයකින් තොර ව, ප්‍රතික්ෂේප කරන්නන්ට (ඉස්ලාමය නොපිළිගන්නන්ට) වඩාත් යහපත් වූ අයුරින් (දහම වෙත) ආරාධනා කිරීම ය. අති උත්තරීතර අල්ලාහ් මේ පිළිබඳ ව මෙසේ ප්‍රකාශ කරයි:

(නබිවරය,) ප්‍රඥාවෙන් යුතුව ද යහපත් උපදෙස මගින් ද නුඹගේ පරමාධිපතිගේ මාර්ගය වෙත (ජනයින්ව) ඇරයුම් කරවු. තවද කවර දෙයක් වඩා යහපත් වන්නේ ද එ(ම යහපත් දැය )මගින් ඔවුන් සමග වාද කරවු. සැබැවින්ම නුඹගේ පරමාධිපති, ඔහුගේ මාර්ගයෙන් මුළාවූවන් පිළිබඳව මැනවින් දන්නාය. තවද ඔහු යහ මග ලැබූවන් පිළිබඳව ද මැනවින් දන්නාය.

[අන්-නහ්ල් 125]

තවද, ගෞරවය දැක්වීමේ අලංකාරවත් ස්වරූපයන් අතරින් තවත් එකක් වන්නේ: මිනිසුන් අතර කිසිදු වෙනසක් තරාතිරම මත පදනම් ව නොකිරීම ය. එබැවින්, විනිශ්චයකාරවරයෙකු තම විනිශ්චය ලබා දීමේ දී දුබලයා සහ ප්‍රභූවරයා (සමාජයේ උසස් යැයි සම්මත තැනැත්තා) අතර වෙනසක් නොකරයි. වෛද්‍යවරයෙකු ධනවතාට ප්‍රතිකාර කිරීමට දක්වන සැලකිල්ල ම දුප්පතාට ප්‍රතිකාර කිරීමේ දී ද දක්වයි. ගුරුවරයෙකු තම සිසුන් අතර කිසිදු වෙනස්කමක් නොකරයි. පියෙකු තම දරුවන් අතර සාධාරණ ව කටයුතු කරයි. තවද, ස්වාමිපුරුෂයෙකු තම භාර්යාවන් අතර යුක්ති

සහගත වීමට (සාධාරණත්වය ඉටු කිරීමට) වගබලා ගනියි. අති උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

සැබැවින්ම අල්ලාහ් යුක්තිය ද යහකම ද ඥාතීන්ට (ඔවුන්ගේ උරුමයන්) පිරිනැමීම ද අණ කරන්නේය. තවද ඔහු අශික්ෂිත දැයින් ද පිළිකුල් සහගත දැයින් ද සීමාව ඉක්මවා යෑමෙන් ද වළක්වාලන්නේය. නුඹලා මෙනෙහි කරනු පිණිස ඔහු නුඹලාට උපදෙස් දෙන්නේය.

[අන්-නහ්ල්: 90]

තවද, ආයිෂා (රළි) තුමිය වාර්තා කරන හදීසයක, නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කර ඇත:

"ඔබට පෙර සිටි මිනිසුන් විනාශයට පත් වූයේ: ඔවුන් අතර සිටි ප්‍රභූවරයෙකු උසස් යැයි සම්මත අයෙකු සොරකම් කළ විට ඔවුන් ඔහුව අත්හැර දැමූ බැවිනි. තවද, ඔවුන් අතර සිටි දුබලයෙකු සොරකම් කළ විට ඔවුන් ඔහුට එරෙහි ව නෛතික දඬුවම් ක්‍රියාත්මක කළ බැවිනි. අල්ලාහ් මත දිවුරා පවසමි! මුහම්මද්ගේ දියණිය වන ෆාතිමා සොරකම් කළ ද, නියත වශයෙන් ම මම ඇගේ අත කපා දමමි."

[ග්‍රන්ථය: බුඛාරි සහ මුස්ලිම්]

තවද, අබූ හුරෙයිරා (රළි) තුමාණන් මෙසේ ප්‍රකාශ කරයි:

"ආහාර අතරින් වඩාත් නරක ම ආහාරය වන්නේ ඒ සඳහා ධනවතුන්ට පමණක් ආරාධනා කරනු ලබන අතර දුප්පතුන්ව අත්හැර දමනු ලබන (විවාහ මංගල්‍යයක් වැනි) උත්සවයක ආහාරයයි."

[ග්‍රන්ථය: බුඛාරි සහ මුස්ලිම්]

ඉස්ලාමීය සහෝදරවරුනි!

රෝගීන්ට, දුර්වලයින්ට සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට (ආබාධිතයින්ට) ද ගෞරව කළ යුතු ය. ඔවුන්ගේ තත්ත්වය පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය. ඔවුන්ට අපහසුතාවන් සහ දුෂ්කරතාවන් මගහැරෙන පරිදි ඔවුන් සමඟ කටයුතු කළ යුතු ය.

උස්මාන් බින් අබිල් ආස් (රළි) තුමාණන්ගෙන් වාර්තා වේ. එතුමාණන්: අල්ලාහ්ගේ දූතයාණෙනි! මාගේ ජනයාගේ ඉමාම්වරයා (නායකයා) බවට මා පත් කරනු මැනව" යැයි පැවසීය. එවිට නබි (සල්) තුමාණන් මෙසේ පැවසූහ:

"ඔබ ඔවුන්ගේ ඉමාම්වරයා වන්න. තවද ඔවුන් අතර සිටින දුර්වල ම පුද්ගලයාගේ තත්ත්වය කෙරෙහි සැලකිලිමත් වෙමින් කටයුතු කරන්න."

[ග්‍රන්ථය: අබූ දාවූද්]

තවද, අබ්දුල්ලාහ් බින් මස්ඌද් (රළි) තුමාණන් වාර්තා කරයි:

එතුමාණන් අරාක් ගසකින් මිස්වාක් (දැහැටි කූරක්) කඩා ගනිමින් සිටියේ ය. එතුමාණන්ගේ කකුල් (කෙණ්ඩා) ඉතා සිහින් විය. සුළඟ හමන විට එයට ඔහු සෙලවෙන්නට විය. මෙය දුටු පිරිස ඔහුට සිනාසුනහ. එවිට අල්ලාහ්ගේ දූතයාණන් (සල්) තුමාණන්: "ඔබ සිනාසෙන්නේ කුමක් දැක ද?"

යැයි ඇසූහ. ඔවුන්: "අහෝ අල්ලාහ්ගේ නබිවරය! ඔහුගේ කකුල්වල ඇති සිහින් බව දැකයි" යනුවෙන් පැවසූහ. එවිට එතුමාණන් මෙසේ පැවසූහ: "මාගේ ප්‍රාණය කවරෙකුගේ අතෙහි තිබෙන්නේ ද, ඔහු මත දිවුරා පවසමි! නියත වශයෙන් ම, තරාදියේ දී (පරලොව දී) එම කකුල් දෙක උහුද් කන්දට වඩා බරින් යුක්ත වනු ඇත."

[ග්‍රන්ථය: අහ්මද්]

ගෞරවය දැක්වීමේ තවත් ස්වරූපයක් වන්නේ: පිරිසිදු ඉස්ලාමීය නීතියට (ශරීආවට) පටහැනි නොවන ජනයාගේ සිරිත් විරිත්වලට ගරු කිරීම ය. අති උත්තරීතර අල්ලාහ් මේ පිළිබඳ ව මෙසේ ප්‍රකාශ කරයි:

සමාවදීම නුඹගේ ගුණාංගයක් ලෙස ගනිවු. යහපත විධානය කරවු. තවද අඥානයින්ව නොසලකා හරිවු.

[සූරා අල්-අඃරාෆ්: 199]

මෙහිදී 'අල්-උර්ෆ්' (العُرْف) යන්නෙන් අදහස් වන්නේ, යහපත් කරුණු සම්බන්ධයෙන් මිනිසුන් අතර පිළිගැනීමට ලක්ව ඇති දෑ සිරිත් විරිත් ය.

අල්ලාහ් මා ද ඔබ ද යහපත් චරිතයකින් යුතු ඔහුගේ මැවීම්වලට යහපත කරන අය අතරට එක් කරත්වා! මාගේ මෙම වදන් මම මෙලෙස ප්‍රකාශ කර සිටිමි. තවද මා වෙනුවෙන් ද, ඔබ වෙනුවෙන් ද සෙසු සියලු මුස්ලිම්වරුන් වෙනුවෙන් ද අල්ලාහ්ගෙන් මම සමාව අයදිමි. එබැවින් ඔබ ද ඔහුගෙන් සමාව අයදින්න. නියත වශයෙන් ම ඔහු අතිශය ක්ෂමාශීලී ය, මහා කරුණාන්විත ය.

## දෙවන දේශනාව

සියලු ප්‍රශංසා අල්ලාහ්ට ම හිමිය. නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිදු දෙවියෙකු නොමැති බවට මම සාක්ෂි දරමි. තවද, මුහම්මද් (සල්) තුමාණන් යනු අල්ලාහ්ගේ ගැත්තා ද, දූතයාණන් ද, ඔහු විසින් තෝරාපත් කරගනු ලැබූ උත්තමයාණන් ද බවට මම සාක්ෂි දරමි. එතුමාණන්ට ද, එතුමාණන්ගේ පවුලේ අයට ද, සහගාමිකයින්ට ද, එතුමාණන්ට පක්ෂපාතී වූ (අනුගමනය කළ) සියල්ලන්ට ද අල්ලාහ්ගේ ආශිර්වාදය සහ අසීමිත වූ ශාන්තිය හිමි වේවා!

ප්‍රශංසනීය වූ ගෞරවය දැක්වීමේ ස්වරූපයන් අතරින් එකක් වන්නේ: දෙමාපියන්ට ගෞරව කිරීම සහ ඔවුන් සමඟ ආචාරශීලී ව (යහපත් අයුරින්) කටයුතු කිරීම ය. ඉමාම් බුහාරි තුමාගේ 'අල්-අදබුල් මුෆ්රද්' යන ග්‍රන්ථයෙහි මෙසේ සඳහන් වේ.

අබූ හුරෙයිරා (රළි) තුමාණන් මිනිසුන් දෙදෙනෙකු දුටුවේ ය. එවිට ඔහු ඉන් එක් අයෙකුගෙන් අනෙකා පෙන්වා මොහු ඔබට කවුරුන් වන්නේ ද? යැයි ඇසුවේ ය. එවිට ඔහු මාගේ පියා යැයි පිළිතුරු දුන්නේ ය. එවිට එතුමාණන් මෙසේ පැවසුවේ ය. ඔබ ඔහුට ඔහුගේ නමින් ආමන්ත්‍රණය නොකරන්න. ඔහුට ඉදිරියෙන් ගමන් නොකරන්න. තවද ඔහු අසුන් ගැනීමට පෙර ඔබ අසුන් නොගන්න.

**[මෙය අල්බානි තුමා විසින් 'සහීහ්' යැයි තහවුරු කර ඇත].**

**එලෙස ම, පාලකයින්ට, ආගමික වියතුන්ට (උලමාවරුන්ට), අල්-කුර්ආනය දරන්නන්ට (එනම් එය කටපාඩම් කළ හා පිළිපදින්නන්ට) සහ වැඩිහිටියන්ට ගෞරව කිරීම ද මෙයට ම ඇතුළත් වේ. අබූ මූසා අල්-අෂ්අරී (රළි) තුමාණන් විසින් වාර්තා කරන ලද හදීසයක නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කර ඇත.**

**නියත වශයෙන් ම, අති උත්තරීතර අල්ලාහ්ව මහිමයට පත් කිරීමේ (ගෞරව කිරීමේ) අංගයක් වන්නේ වයෝවෘද්ධ මුස්ලිම්වරයාට ගෞරව කිරීමත්, අල්-කුර්ආනය දරන්නාට එනම් එහි සීමාවන් ඉක්මවා නොයන හා එය අත්හැර නොදමන අය - ගෞරව කිරීමත්, යුක්ති සහගත පාලකයාට ගෞරව කිරීමත් ය.**

**[ග්‍රන්ථය: අබූ දාවූද්]**

### මුස්ලිම් සහෝදරවරුනි!

**මෙම උතුම් ගුණධර්මය අපට කෙතරම් නම් අවශ්‍ය වී තිබේ ද ගෞරවය දැක්වීම මඟින් සමාජය තුළ කොතරම් නම් ආදරයක් සහ සෙනෙහසක් උදා කර දෙන්නේ ද තවද එයින් කොතරම් නම් සශ්‍රීක වූ ප්‍රතිඵල ලබා දී තිබේ ද නියත වශයෙන් ම, මිනිසුන් තමන්ට යහපත කරන්නන්ව ප්‍රිය කරති; එය යහපත් වචනයකින් හෝ අවංක සිනහවකින් වුව ද කම් නැත. එහෙත් තමන්ට අයහපත කරන්නන්ට (සිත් රිදවන්නන්ට) ඔවුහු ප්‍රිය නොකරති; ඔහු සත්‍යය දරා සිටින්නෙකු හෝ යහපත ගෙන එන්නෙකු වුව ද කම් නැත.**

**ජනයාට යහපත කරන්න, එවිට ඔබට ඔවුන්ගේ හදවත් දිනාගත (නතු කරගත) හැකි ය. මන්ද යත්, සෑම විටම මිනිසාව යටපත් කරගනු ලබන්නේ යහපත්කම් මඟිනි.**

### අල්ලාහ්ගේ ගැත්තනි!

**අල්ලාහ්ගේ අනිවාර්ය යුතුකම් (ෆර්ල්) ඉටු කිරීම සහ අල්ලාහ්ගේ මැවීම්වලට එනම් ජනයාට යහපත කිරීම අතර පවතින දැඩි සබැඳියාව අප මැනවින් අවබෝධ කරගත යුතු ය. අති උත්තරීතර අල්ලාහ් මේ පිළිබඳ ව මෙසේ ප්‍රකාශ කරයි:**

**අල්ලාහ් හැර වෙනත් කිසිවෙකු නොනමදිවු. දෙමාපියන්ට ද තවද ඥාතීන්ට ද අනාථයින්ට ද දුගියන්ට ද යහපත ඉටු කරවු. තවද නුඹලා මිනිසුනට යහ දේ පවසවු. තවද සලාතය* ස්ථිරවම ඉටු කරවු. zසකාතය* පිරිනමවු යැයි අප ඉස්රාඊල්ගේ* දරුවන්ගෙන් ප්‍රතිඥාව ගත් අවස්ථාව (සිහිපත් කරවු). පසුව නුඹලාගෙන් ස්වල්ප දෙනෙකු හැර (අන් සියල්ලන් සත්‍යය) මගහරිමින් (ප්‍රතිඥාවට) පිටු පෑවෝය.**

**[සූරා අල්-බකරා: 83]**

**යා අල්ලාහ්! ඔබගේ ගැත්තාගෙන් ද, නබිවරයාණන් ද වන මුහම්මද් (සල්) තුමාණන් හට ඔබගේ ආශිර්වාදය සහ ශාන්තිය හිමි කර දෙනු මැනව! එතුමාණන්ගේ සියලු සහගාමිකයින් (සහාබාවරුන්) කෙරෙහි ද ඔබගේ තෘප්තිය ලබා දෙනු මැනව! අතිශය කරුණාන්විත වූවන් අතුරින් වඩාත්**

**කරුණාන්විත වූවාණෙනි ඔබගේ අසීමිත වූ දයාවෙන් ඔවුන් සමඟ සහ අප කෙරෙහි ද ඔබතුමාණන්ගේ තෘප්තිය හිමි ලබා දෙනු මැනව!**

**යා අල්ලාහ්! ඔබව මෙනෙහි කිරීමටත්, ඔබට කෘතඥපූර්වක වීමටත්, වඩාත් යහපත් අයුරින් ඔබට නැමදුම් කිරීමටත් අප හට උපකාර කරනු මැනව!**

**යා අල්ලාහ් ඔබ අපට පක්ෂපාතී වනු මැනව තවද අපට එරෙහි නොවනු මැනව. අපට ජයග්‍රහණය ලබා දෙනු මැනව අපට එරෙහි ව අන් අයට ජයග්‍රහණය ලබා නොදෙනු මැනව. අපට යහමඟ පෙන්වා දෙනු මැනව තවද අපට එම යහමඟට පිවිසීම පහසු කර දෙනු මැනව!**

**යා අල්ලාහ් කුවේට් රාජ්‍යයත්, එහි වැසියනුත් සියලු අයහපත් සහ විපත්තිදායක දේවලින් ආරක්ෂා කරනු මැනව! මෙම දේශයත්, සෙසු සියලු මුස්ලිම් දේශයනුත් ආරක්ෂිත සහ සන්සුන් දේශයන් බවට පත් කරනු මැනව!**

**යා අල්ලාහ් දේශසීමාවන්හි රැකවල් ලා සිටින අපගේ සහෝදරවරුන් ද, ආරක්ෂක බලකායන්, ආරක්ෂක අංශ, ජාතික ආරක්ෂක බලමුළුව සහ රටේ ආරක්ෂාව වෙනුවෙන් කැප වී සිටින සියලු දෙනා ද ආරක්ෂා කරනු මැනව! තවද, ඔවුන්ගේ පාද භූමියේ ස්ථිර කරනු මැනව (එනම්, ඔවුන්ට නොසැලෙන ස්ථාවරත්වය සහ ශක්තිය ලබා දෙනු මැනව)!**

**යා අල්ලාහ්! අපගේ අමීර්වරයාට (පාලකයාට) සහ කිරුළ හිමි කුමරුට ඔබ ප්‍රිය කරන සහ ඔබ තෘප්තිමත් වන යහපත් ක්‍රියාවන්හි නිරත වීමට භාග්‍යය ලබා දෙනු මැනව! තවද, යහපත්කම හා බියබැතිමත්භාවය (තක්වාව) වෙත ඔවුන් දෙදෙනාව මුළුමනින් ම මෙහෙයවනු මැනව!**

**අපගේ අවසන් ප්‍රාර්ථනාව වනුයේ, සර්ව ලෝක පරමාධිපති වූ අල්ලාහ්ට ම සියලු ප්‍රශංසා හිමි වේවා! යන්නයි.**